# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව

---

## ශ්‍රී ලංකා පහසුකම් කළමනාකරණ ආයතනය (සංස්ථාගත කිරීමේ)

**ශ්‍රී ලංකා පහසුකම් කළමනාකරණ ආයතනය සංස්ථාගත කිරීම සඳහා වූ පනත් කෙටුම්පතකි**

---

වන්නි දිස්ත්‍රික් පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු කේ. කාදර් මස්තාන් මහතා විසින්
2025 අගෝස්තු මස 06 වන දින ඉදිරිපත් කරන ලදී

(ගැසට් පත්‍රයේ පළ කළේ 2025 ජූලි මස 18 වන දින)

මුද්‍රණය කිරීමට පාර්ලිමේන්තුව විසින් නියෝග කරන ලදී

---

[30 වන පනත් කෙටුම්පත]

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී
කොළඹ 5, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිල දී ලබාගත හැක

**මිල : රු. 87.00** **තැපැල් ගාස්තුව : රු. 150.00**

මෙම පනත් කෙටුම්පත www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

# ශ්‍රී ලංකා පහසුකම් කළමනාකරණ ආයතනය (සංස්ථාගත කිරීමේ)

## ශ්‍රී ලංකා පහසුකම් කළමනාකරණ ආයතනය සංස්ථාගත කිරීම සඳහා වූ පනතකි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ:-

ලුහුඬු නාමය

1. මේ පනත 2025 අංක දරන ශ්‍රී ලංකා පහසුකම් කළමනාකරණ ආයතනය (සංස්ථාගත කිරීමේ) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ.

ශ්‍රී ලංකා පහසුකම් කළමනාකරණ ආයතනය සංස්ථාගත කිරීම

2. (1) මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භ වන දින සිට සහ ඉන් පසුව (මෙහි මින් මතු ''ආයතනය'' යනුවෙන් සඳහන් කරනු ලබන) ශ්‍රී ලංකා පහසුකම් කළමනාකරණ ආයතනයේ දැනට සාමාජිකයන් වශයෙන් සිටිනතාක් තැනැත්තන් සහ මෙයින් සංස්ථාපනය කරනු ලබන සංස්ථාවට මින් මතු සාමාජිකයන් වශයෙන් බඳවාගනු ලබන තැනැත්තන් (මෙහි මින් මතු ''සංස්ථාපිත මණ්ඩලය'' යනුවෙන් සඳහන් කරනු ලබන) ශ්‍රී ලංකා පහසුකම් කළමනාකරණ ආයතනය යන නාමය හා අභිධානය යටතේ අවිච්ඡින්න පැවැත්මක් ඇති සංස්ථාවක් විය යුතු අතර, එකී නාමයෙන් එය විසින් ද, ඊට විරුද්ධව ද, සියලු අධිකරණයන් හි නඩු පැවරිය හැකි අතර, පොදු මුද්‍රාවක් තබා ගැනීමේ සහ එය භාවිත කිරීමේ දී ස්වකීය අභිමතය පරිදි එය වෙනස් කිරීමේ ද එයට ආනුෂංගික වූ හෝ සම්බන්ධිත වෙනත් සියලු කාරණා සහ දේ කිරීමේ ද පූර්ණ බලය හා අධිකාරය එයට ඇත්තේ ය.

(2) සංස්ථාපිත මණ්ඩලය එහි සාමාජිකත්වයේ බහුතරයේ යහපත හා ශුභ සිද්ධිය මේ පනතින් සහ රීති මගින් සලසා ඇති ආකාරයට නියෝජනය කළ යුතු අතර, පහසුකම් කළමනාකරණ වෘත්තියේ වෘත්තීය ප්‍රමිති අනුගමනය කළ යුතු ය.

(3) සංස්ථාපිත මණ්ඩලයේ නිල කෙටි යෙදුම IFMSL විය යුතු ය.

සංස්ථාපිත මණ්ඩලයේ පොදු පරමාර්ථ

3. සංස්ථාපිත මණ්ඩලය සංස්ථාපනය කරනු ලබන්නේ යම් පොදු පරමාර්ථ සඳහා ද, ඒ පොදු පරමාර්ථ පහත දැක්වෙන ආකාරයෙන් විය යුතු යයි මෙයින් ප්‍රකාශ කරනු ලැබේ:-

(අ) පහසුකම් කළමනාකරණ වෘත්තීයට අදාළව වෘත්තියේ සබඳතා, තත්ත්වය, ශුභ සිද්ධිය, අයිතීන් සහ වරප්‍රසාද සහ මහජන බැඳියාවන් ආරක්ෂා කිරීම සහ ප්‍රවර්ධනය කිරීම;

(ආ) පහසුකම් කළමනාකරණය හා සම්බන්ධිත කාරණා පිළිබඳ පොදු බලධරයන්ට උපදෙස් දීම සහ අදහස් හුවමාරු කර ගැනීම;

(ඇ) පහසුකම් කළමනාකරණය පිළිබඳ සංස්ථාපිත මණ්ඩලයට යොමු කරනු ලබන යම් ආරාවුල් බේරුම් කිරීම;

(ඈ) පහසුකම් කළමනාකරණය සහ ඊට සම්බන්ධිත විෂයයන් පිළිබඳ දැනුම ව්‍යාප්ත කිරීම සඳහා දේශන සහ සාකච්ඡා සංවිධානය කිරීම සහ පොත් හා වෙනත් දේ පළ කිරීම;

(ඉ) පහසුකම් කළමනාකරණයට අදාළ නීති සහ ව්‍යවහාර අධ්‍යයනය කිරීම ධෛර්යමත් කිරීම;

(ඊ) පහසුකම් කළමනාකරණ ක්ෂේත්‍රයෙහි අත්කරගනු ලබන ජයග්‍රහණ උදෙසා, ප්‍රදාන සහ ත්‍යාග නිර්මාණය කිරීම සහ ප්‍රදානය කිරීම;

(උ) සංස්ථාපිත මණ්ඩලයේ සාමාජිකත්වයට ඇතුළුවීම සංවිධාන කිරීම, අධීක්ෂණය කිරීම සහ පාලනය කිරීම, පහසුකම් කළමනාකරණය හැදෑරීමට අපේක්ෂා කරනු ලබන තැනැත්තන්ට වෘත්තීය අධ්‍යාපනය පාඨමාලා සහ පුහුණුව ලබාදීම, භාර ගැනීම සහ එය විධිමත් කිරීම, සංස්ථාපිත මණ්ඩලයේ සාමාජිකත්වය සඳහා අධ්‍යයන පාඨමාලා සහ සුදුසුකම් ලැබීමේ විභාග නිශ්චය කිරීම සහ අනුමත කිරීම, එවැනි පාඨමාලා සහ විභාග මෙහෙයවීම හෝ මෙහෙයවීම සඳහා සැලැස්වීම සහ පහසුකම්

කළමනාකරණ ක්ෂේත්‍රය පිළිබඳ අධ්‍යාපන වැඩිදියුණු කිරීම සඳහා පිළිගත් අධ්‍යාපන ආයතන සමඟ සහයෝගීව කටයුතු කිරීම; සහ

(ඌ) ආයතනයේ සාමාජිකත්වය සඳහා අවශ්‍ය සුදුසුකම් හා නුසුදුසුකම් ද, සංස්ථාපිත මණ්ඩලයේ සාමාජිකත්වය සඳහා වන වෘත්තීය පැවැත්මේ ප්‍රමිති ද නියම කිරීම සහ ඒවාට අනුගතව ක්‍රියා කිරීම සහතික කිරීම.

සංස්ථාපිත මණ්ඩලයේ බලතල සහ කාර්ය

**4.** මෙම පනතේ සහ වෙනත් යම් ලිඛිත නීතියක විධිවිධානවලට යටත්ව පහත සඳහන් දේ ඇතුළුව, සංස්ථාපිත මණ්ඩලයේ පරමාර්ථ සාක්ෂාත් කර ගැනීම සඳහා අවශ්‍ය වෙනත් සියලු ක්‍රියා කිරීම, ඉටු කිරීම සහ ක්‍රියාත්මක කිරීම සඳහා සංස්ථාපිත මණ්ඩලයට පහත සඳහන් බලතල තිබිය යුතු ය:-

(අ) සංස්ථාපිත මණ්ඩලයේ කාර්ය සඳහා යම් නිශ්චල දේපළ අත්කර ගැනීම, දැරීම, බද්දට හෝ කුලියට ගැනීම හෝ දීම හෝ උකසට දීම, ඔඩපනය කිරීම, විකිණීම, හුවමාරු කිරීම හෝ අන්‍යාකාරයෙන් අන්සතු කිරීම, යටතට පත් කිරීම හෝ බැහැර කිරීම;

(ආ) ජර්නල, නිබන්ධන, පොත්, වාර සඟරා, පුවත්පත් ලිපි ප්‍රකාශයට පත්කිරීම සහ පහසුකම් කළමනාකරණය පිළිබඳ තොරතුරු ව්‍යාප්ත කිරීම මාධ්‍ය හරහා උචිත තොරතුරු නිකුත් කිරීම;

(ඇ) සංස්ථාපිත මණ්ඩලයේ පරමාර්ථවලට සමාන පරමාර්ථ ඇති ශ්‍රී ලංකාවේ හෝ විදේශ රටවල වෙනත් පුද්ගලයන්, නියෝජිත ආයතන සහ සංවිධාන සමඟ එක්ව කටයුතු කිරීම, ආධාර කිරීම, ආධාර ලබා ගැනීම සහ සම්බන්ධකම් වර්ධනය කර ගැනීම;

(ඈ) ත්‍යාග, පරිත්‍යාග හෝ රික්තවරණ භාරගැනීම සහ එවැනි යම් ත්‍යාග, පරිත්‍යාග හෝ රික්තවරණවලට යාව ඇති යම් භාර ක්‍රියාත්මක කිරීම;

(ඉ) සංස්ථාපිත මණ්ඩලයේ පරමාර්ථ ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය නිලධරයන් සහ සේවකයන් පත් කිරීම, සේවයේ නියුක්ත කිරීම, මාරු කිරීම, ඔවුන් කෙරෙහි විනය පාලන පවත්වාගෙන යාම සහ සේවයෙන් පහකිරීම සහ සේවයේ නියමයන් සහ කොන්දේසි නිශ්චය කිරීම;

(ඊ) සංස්ථාපිත මණ්ඩලයේ කාර්ය සඳහා අවශ්‍ය වන්නා වූ යම් මුදල්, සංස්ථාපිත මණ්ඩලයට සිතන ආකාරයේ නියම වලට යටත්ව සහ සුරැකුම් මත ණයට ගැනීම;

(උ) සාමාජිකත්වයේ යම් ශ්‍රේණියකට යම් තැනැත්තකු ඇතුළු කිරීම සහ එකී සාමාජිකත්වය අලුත් කිරීම;

(ඌ) සංස්ථාපිත මණ්ඩලය විසින් පවත්වනු ලබන සුදුසුකම් හා ලැබීමේ පරීක්ෂණ අධ්‍යයන පාඨමාලා සඳහා තැනැත්තන් ඇතුළු කරගැනීමට ඇතුළුවීමේ ගාස්තු අය කිරීම;

(එ) සංස්ථාපිත මණ්ඩලයේ කාර්ය සඳහා වහා අවශ්‍ය නොවන යම් මුදල්, සංස්ථාපිත මණ්ඩලය විසින් සුදුසු යැයි සලකනු ලබන ආකාරයට ආයෝජනය කිරීම, භාර ඇති කිරීම සහ පරිපාලනය කිරීම සහ යම් බැංකුවක ජංගම තැන්පත් හෝ ඉතිරිකිරීමේ ගිණුම් පවත්වාගෙන යාම;

(ඒ) සංස්ථාපිත මණ්ඩලය සඳහා වෘත්තීය සැලැස්මක් සම්මත කරගැනීම සහ එය ක්‍රියාත්මක කිරීම පිණිස විධිවිධාන සැලැස්වීම;

(ඔ) සංස්ථාපිත මණ්ඩලයේ විධිමත් කළමනාකරණය සහ ව්‍යවස්ථානුරූපී අයිතිය සහතික කිරීම;

(ඕ) සංස්ථාපිත මණ්ඩලයේ මහා සභා රැස්වීමකදී, සාමාජිකයන්ගේ අවශ්‍ය බහුතරයේ ඡන්දයෙන් වරින් වර රීති සම්මත කරගැනීම සහ සංස්ථාපිත

මණ්ඩලයේ කටයුතු කළමනාකරණය කිරීම සඳහා සහ එහි පරමාර්ථ ඉෂ්ට කරගැනීම සඳහා රීති සෑදීම; සහ

(ක) සංස්ථාපිත මණ්ඩලයේ පරමාර්ථ මුදුන්පත් කරගැනීම සඳහා ආනුෂංගික වූ හෝ යෝග්‍ය වූ නෛතික සියලු දේ කිරීම.

සංස්ථාපිත මණ්ඩලයේ මහා සභාව

**5.** මේ පනතේ විධිවිධානවලට සහ පනත යටතේ සාදන ලද රීතිවලට ද යටත් ව සංස්ථාපිත මණ්ඩලයේ කළමනාකරණය, පාලනය සහ පරිපාලනය මේ පනතේ 21 වන වගන්තිය පිළිපදිමින් සාදනු ලබන රීතිවලට අනුකූලව තෝරා පත් කරගනු ලබන හෝ පත්කරනු ලබන නිල දරන්නන් සහ වෙනත් සාමාජිකයන්ගෙන් සමන්විත (මෙහි මින් මතු "සභාව" යනුවෙන් හඳුන්වනු ලබන) මහා සභාව විසින් ක්‍රියාත්මක කළ යුතු ය.

සංස්ථාපිත මණ්ඩලයේ ප්‍රථම සභාව

**6.** (1) සංස්ථාපිත මණ්ඩලයේ ප්‍රථම සභාව මේ පනත ආරම්භවන දිනයට පෙරාතුවම වූ දිනයේ දී නිල දරන ආයතනයේ සභාවේ සාමාජිකයන්ගෙන් සමන්විත විය යුතු ය.

(2) සභාව සභාපති, උප සභාපති, අපරගාමී සභාවක් වූ කල්හි ආසන්නතම හිටපු සභාපති, ලේකම්, භාණ්ඩාගාරික, සහකාර ලේකම්, සහකාර භාණ්ඩාගාරික සහ සභාවේ රීතිවලට අනුකූලව තෝරාපත් කරගත් හෝ පත් කරගත් නවයකට අඩු නොවූ වෘත්තීය සාමාජිකයන්ගෙන් ද සමන්විත විය යුතු ය.

සාමාජික නාමලේඛනය

**7.** (1) සභාව විසින්, මේ පනත ආරම්භ වන දිනයට පෙරාතුව ම වූ දිනයේ දී ආයතනයේ සාමාජිකයකුව සිටියා වූ සෑම තැනැත්තකුගේම සහ මින් පසු මෙයින් සංස්ථාපනය කරනු ලබන සංස්ථාපිත මණ්ඩලයේ සාමාජිකයකු වශයෙන් විධිමත් ලෙස ඇතුළත් කරගනු ලබන්නා වූ සෑම තැනැත්තකුගේ නම් ඇතුළත් සාමාජික නාමලේඛනයක් පවත්වාගෙන යා යුතු ය.

(2) සභාව සංස්ථාපිත මණ්ඩලයේ රීතිවලට අනුකූලව රැස්වී කටයුතු කළ යුතු ය.

**මණ්ඩල සහ කමිටු ස්ථාපිත කිරීම**

8. සභාව විසින් සුදුසු යැයි සිතන ආකාරයට මණ්ඩල සහ කමිටු ස්ථාපිත කළ හැකි අතර, එකී මණ්ඩල සහ කමිටුවල බලතල ලෙස අර්ථ ගන්වා ඇති බලතලවලට යටත් ව සුදුසු යැයි හැඟෙන බලතල ඒවාට පවරනු ලැබිය හැකි ය.

**සංස්ථාපිත මණ්ඩලයේ සාමාජිකත්වය**

9. (1) මේ පනතේ විධිවිධානවලට යටත්ව සාමාජිකත්වයේ එක් එක් ශ්‍රේණිය සඳහා වූ සුදුසුකම් මේ පනත යටතේ සාදනු ලබන රීතිවල නිශ්චිතව සඳහන් කළ යුතු ය.

(2) සාමාජිකත්වය පහත දැක්වෙන ශ්‍රේණිවලින් සමන්විත විය යුතු ය:-

(අ) ශිෂ්‍ය;

(ආ) ආශ්‍රිත;

(ඇ) සාමාජික;

(ඈ) අධි සාමාජික; සහ

(ඉ) ගරු සාමාජික හෝ අධි සාමාජික.

**වෘත්තීය සාමාජිකයින්**

10. (1) ඉහත 9 (2) වගන්තියේ (ඇ) සහ (ඈ) ඡේද යටතේ සඳහන් කොට ඇති සාමාජික ශ්‍රේණි "වෘත්තීය සාමාජික" ලෙස සඳහන් කරනු ලැබේ.

(2) සෑම වෘත්තීය සාමාජිකයකුම සංස්ථාපිත මණ්ඩලයේ සභාව හෝ එහි යම් මණ්ඩලයකට පත් කරනු ලැබීමට සුදුසු විය යුතු අතර එහි සියලු අයිතීන්ට සහ වරප්‍රසාදවලට හිමිකම් ලැබිය යුතු ය.

(3) සෑම සාමාජිකයකුටම සංස්ථාපිත මණ්ඩලයේ මහා සභා රැස්වීම පිළිබඳ දැන්වීම ලැබීමට හිමිකම් ඇති අතර, කෙසේ වුව ද වෘත්තීය සාමාජිකයන්ට පමණක් ඡන්දය පළ කිරීමේ අයිතිය තිබිය යුතු ය.

**ගරු සාමාජිකත්වය**

**11.** සංස්ථාපිත මණ්ඩලය විසින් සභාවේ මතය පරිදි පහසුකම් කළමනාකරණ වෘත්තියට කැපී පෙනෙන සහ විශිෂ්ට සේවයක් කරනු ලැබ ඇති, සංස්ථාපිත මණ්ඩලයේ සාමාජිකයකු නොවන්නා වූ යම් තැනැත්තකුට සභාවේ උපදෙස් මත ගරු සාමාජිකයකු ලෙස සාමාජිකත්වය පිරිනැමීම කරනු ලැබිය හැකි වේ.

**කෙටි පදවි නාම**

**12.** (1) අධි සාමාජිකයකු ලෙස ලියාපදිංචි වී ඇති ආයතනයේ සෑම සාමාජිකයකුටම තම නමට පසු "F.IFMSL" යන කෙටි අභිධානය භාවිත කිරීමට හිමිකම තිබිය යුතු ය.

(2) සාමාජිකයකු ලෙස ලියාපදිංචි වී ඇති ආයතනයේ සෑම සාමාජිකයකුටම තම නමට පසු "M.IFMSL" යන කෙටි අභිධානය භාවිත කිරීමට හිමිකම තිබිය යුතු ය.

(3) ආයතනයේ ආශ්‍රිත සාමාජිකයකු ලෙස ලියාපදිංචි වී ඇති ආයතනයේ සෑම සාමාජිකයකුටම තම නමට පසු "A.IFMSL" යන කෙටි අභිධානය භාවිත කිරීමට හිමිකම් තිබිය යුතු ය.

**සාමාජිකත්ව නිර්ණායක**

**13.** සංස්ථාපිත මණ්ඩලය විසින් කලින් කල, සභාව විසින් නිර්දේශ කරනු ලබන පරිදි, රීතිවලට අනුකූලව සාමාජිකයන් සඳහා අදාළ සාමාජිකත්ව නිර්ණායක සහ සාමාජික ගාස්තු පිළිබඳ තීරණය කරනු ලැබිය යුතු ය.

**වරලත් පහසුකම් කළමනාකරු**

**14.** සෑම වෘත්තීය සාමාජිකයකුට ම, මේ පනතේ විධිවිධානවලට අනුකූලව වරලත් පහසුකම් කළමනාකරුවකු ලෙස ලියාපදිංචි වීමට යටත්ව "වරලත් පහසුකම් කළමනාකරුවකු" යන පදවිනාමය ගැනීමට සහ භාවිත කිරීමට හිමිකම තිබිය යුතු ය.

**"වරලත් පහසුකම් කළමනාකරු" යන පදවිනාමය භාවිත කිරීම**

**15.**(1) මේ පනත යටතේ වරලත් පහසුකම් කළමනාකරුවකු ලෙස ලියාපදිංචි නොවූ කවර හෝ තැනැත්තකුට එකී පදවිනාමය භාවිත කිරීමට හෝ ඔහු විසින් වරලත් පහසුකම් කළමනාකරුවකු ලෙස ලබාදෙන ලද වෘත්තීමය සේවයක් සඳහා ගාස්තු අය කර ගැනීම පිණිස යම් අධිකරණයක් ඉදිරියේ නඩුවක් පැවරීමට හෝ අයිතියක් නොතිබිය යුතු ය.

(2) මේ පනතේ විධිවිධානවලට යටත්ව සෑම වරලත් පහසුකම් කළමනාකරුවකුටම ඔහු හෝ ඇය වරලත් පහසුකම් කළමනාකරුවකු බව පෙන්නුම් කිරීම සඳහා තම නාමයට පසු "C.F.M" යන කෙටි අක්ෂර යෙදීමට හිමිකම් තිබිය යුතු ය.

වරලත් පහසුකම් කළමනාකරුවකු ලෙස ලියාපදිංචි වීම සඳහා ලියාපදිංචි වීමේ ගාස්තු

**16.** සභාව විසින් වරලත් පහසුකම් කළමනාකරුවකු ලෙස ලියාපදිංචි වීම සඳහා වන ඉල්ලුම් පත්‍රයේ ආකෘතිය ද එකී ලියාපදිංචි වීම සහ ලියාපදිංචිය අලුත් කිරීම සඳහා අවශ්‍ය ගාස්තුව ද නියම කළ යුතු ය.

වරලත් පහසුකම් කළමනාකරුවකු ලෙස ලියාපදිංචි වීම සඳහා පොදු නුසුදුසුකම්

**17.** (1) යම් තැනැත්තකු ඔහු හෝ ඇය ආයතනයේ වෘත්තීයේ සාමාජිකයකු නොවන්නේ නම්, වරලත් පහසුකම් කළමනාකරුවකු ලෙස ලියාපදිංචි කරනු නොලැබිය යුතු ය.

(2) කිසිදු තැනැත්තකු,-

(අ) වයස අවුරුදු විසි එක ලබා නැත්තම්;

(ආ) ශ්‍රී ලංකාවේ පුරවැසියකු නොවන්නේ නම්;

(ඇ) මානසික දුබලතාවකින් පෙළෙන්නකු බවට නිසි අධිකරණ බලය ඇති අධිකරණයකින් තීන්දු කොට ඇත්නම්;

(ඈ) බංකොලොත්භාවයට හෝ වස්තු භංගත්වයට පත් තැනැත්තකු ලෙස නිසි අධිකරණ බලය ඇති අධිකරණයක් මගින් තීන්දු කොට ඇත්නම්; හෝ

(ඉ) සිර දඬුවමකින් හෝ සමාන දඬුවමකින් දඬුවම් පැමිණවිය යුතු චරිත දූෂණය පිළිබඳ වරදක් සම්බන්ධයෙන් ශ්‍රී ලංකාවේ හෝ වෙනත් රටක නිසි අධිකරණ බලය ඇති අධිකරණයක් මගින් දඬුවම් පමුණුවනු ලැබ ඇත්තේ නම් සහ ඒ සඳහා සමාවක් ප්‍රදානය කරනු ලැබ නොමැති නම්,

ඒ තැනැත්තා වරලත් පහසුකම් කළමනාකරුවකු ලෙස ලියාපදිංචි වීමට හිමිකම් නොලබන්නේ ය.

සාමාජිකත්ව කටයුතු පිළිබඳ මණ්ඩලය සහ එහි සංයුතිය

**18.** (1) 8 වන වගන්තියේ විධිවිධානවලට යටත්ව, සංස්ථාපිත මණ්ඩලය සඳහා "සාමාජිකත්ව කටයුතු පිළිබඳ මණ්ඩලය යනුවෙන් හඳුන්වනු ලබන මණ්ඩලයක්" පිහිටුවිය යුතු ය.

(2) සාමාජිකත්ව කටයුතු පිළිබඳ මණ්ඩලය පහත සඳහන් තැනැත්තන්ගෙන් සමන්විත විය යුතු ය:-

(අ) මණ්ඩලයේ සභාපතිවරයා විය යුතු, සංස්ථාපිත මණ්ඩලයේ වාර්ෂික මහා සභා රැස්වීමක දී හෝ අති විශේෂ මහා සභා රැස්වීමක දී තෝරා පත් කර ගත යුතු වූ ද, ආයතනයේ ආදි සභාපතිවරයකු වූ ද තැනැත්තකු; සහ

(ආ) සභාව විසින් පත්කරනු ලබන, ආයතනයේ වෘත්තීය සාමාජිකයන් තිදෙනකු.

සාමාජිකත්ව කටයුතු පිළිබඳ මණ්ඩලයේ ධුර කාලය

**19.** සභාපතිවරයා සහ අවස්ථාවෝචිත පරිදි නම් කළ හෝ තෝරා පත් කර ගනු ලබන සාමාජිකයන් එක් වර්ෂයක් (01) ධුර දැරිය යුතු අතර, එකී එක් වර්ෂය නිමවීමේ දී අවස්ථාවෝචිත පරිදි එකී සභාපතිවරයා හෝ සාමාජිකයා සාමාජිකත්ව කටයුතු පිළිබඳ මණ්ඩලයේ ධුර දැරීම අවසන්වීමේ දී නැවත තෝරා පත් කරනු ලැබීමට හිමිකම් තිබිය යුතු ය.

සාමාජිකත්ව කටයුතු පිළිබඳ මණ්ඩලයේ රැස්වීම

**20.** සාමාජිකත්ව කටයුතු පිළිබඳ මණ්ඩලයේ සෑම රැස්වීමක දීම, සභාපතිවරයා පැමිණ සිටින්නේ නම් ඔහු මූලාසනය දැරිය යුතු අතර, සභාපතිවරයා පැමිණ නොසිටින රැස්වීම්වල දී පැමිණ සිටින සාමාජිකයන් විසින් ඔවුන් අතුරෙන් තැනැත්තකු මූලාසනය දැරීම සඳහා පත් කර ගනු ලැබිය යුතු ය.

සාමාජිකත්ව කටයුතු පිළිබඳ මණ්ඩලයේ රෙජිස්ට්‍රාර්වරයා/ ලේකම්වරයා

**21.** (1) සභාව විසින් සාමාජිකත්ව පිළිබඳ මණ්ඩලයට රෙජිස්ට්‍රාර්වරයකු පත්කළ යුතු අතර, ඔහු එකී මණ්ඩලයේ ලේකම්වරයා ද විය යුතු ය.

(2) රෙජිස්ට්‍රාර්වරයා මණ්ඩලයේ රැස්වීම්වල කාර්ය පිළිබඳ සටහන් තබාගත යුතු ය.

සාමාජිකත්ව කටයුතු පිළිබඳ මණ්ඩලයේ ධුරයෙන් ඉවත් වීම

**22.** (1) සාමාජිකත්ව කටයුතු පිළිබඳ මණ්ඩලයේ සාමාජිකයකු විසින් මණ්ඩලයේ අඛණ්ඩ රැස්වීම් තුනකට පැමිණ නොතිබීම හෝ මාස හයක කාලය ඉක්ම වූ කාලයක් ශ්‍රී ලංකාවෙන් බැහැරව සිටීම හෝ රෙජිස්ට්‍රාර්වරයා වෙත ඉල්ලා අස්වීම භාරදීමෙන් හෝ තම ධුරය හිස් කරන්නේ ය.

(2) අවස්ථාවෝචිත පරිදි තෝරා පත් කර ගනු ලැබූ හෝ නම් කළ හෝ මණ්ඩලයේ යම් සාමාජිකයකු මියගියහොත් හෝ ධුරය හිස් කළහොත් එවිට, ඒ සාමාජිකයා වෙනුවට වෙනත් සාමාජිකයකු තෝරා පත් කර ගනු ලැබිය යුතු අතර, එකී තැනැත්තා එකී සාමාජිකයාගේ ඉකුත් නොවූ ධුර කාලය සඳහා ධුරය දැරිය යුතු ය.

සාමාජිකත්ව කටයුතු පිළිබඳ මණ්ඩලයේ සාමාජිකත්වයට නුසුදුසු වීම

**23.** (1) සාමාජිකත්ව කටයුතු පිළිබඳ මණ්ඩලයේ සාමාජිකත්වය සඳහා වන නුසුදුසුකම් සභාව විසින් නිශ්චය කරනු ලැබිය යුතු ය.

(2) යම් සාමාජිකයකු සාමාජිකත්ව කටයුතු පිළිබඳ මණ්ඩලයෙන් ඉවත් කිරීමට සභාවට බලය තිබිය යුතු ය.

(3) මෙහි ඇතුළත් විධිවිධානවලට යටත්ව, සාමාජිකත්ව කටයුතු පිළිබඳ මණ්ඩලය විසින් එහි රැස්වීම් සහ රැස්වීම්වල දී කටයුතු කරගෙන යාම සම්බන්ධයෙන් තම කාර්ය පටිපාටිය විධිමත් කරනු ලැබිය හැකි ය.

සාමාජිකත්ව කටයුතු පිළිබඳ මණ්ඩලයේ කර්තව්‍ය

**24.** සාමාජිකත්ව කටයුතු පිළිබඳ මණ්ඩලයේ කර්තව්‍ය වනුයේ:-

(අ) වරලත් පහසුකම් කළමනාකරුවන් ලෙස මේ පනත යටතේ ලියාපදිංචිවීමට සුදුසුකම් ලත් වෘත්තීය සාමාජිකයන් වරලත් පහසුකම් කළමනාකරුවන් ලෙස ලියාපදිංචි කිරීම;

(ආ) මේ පනතේ විධිවිධානවලට අනුකූලව එවැනි ලියාපදිංචි කිරීම් අත්හිටුවීම හෝ අවලංගු කිරීම හෝ ප්‍රතිස්ථාපනය කිරීම; සහ

(ඇ) වරලත් පහසුකම් කළමනාකරුවන්ගේ නාමලේඛනයක් පවත්වාගෙන යාම සහ ප්‍රසිද්ධ කිරීම.

වරලත් පහසුකම් කළමනාකරුවන්ගේ නාමලේඛනය

**25.** (1) රෙජිස්ට්‍රාර්වරයා විසින් සාමාජිකත්ව කටයුතු පිළිබඳ මණ්ඩලයේ විධිවිධානවලට යටත්ව එකී මණ්ඩලයේ ප්‍රථම රැස්වීමේ දිනයෙන් මාස හයක් ඉකුත්වීමට පෙර වරලත් පහසුකම් කළමනාකරුවන්ගේ නාමලේඛනයක් පිළියෙළ කළ යුතු ය.

(2) මණ්ඩලය විසින්, එසේ පිළියෙළ කරනු ලැබූ නාමලේඛනයේ පිටපත්, මණ්ඩලයේ ප්‍රථම රැස්වීමේ දිනය පසුවීමෙන් එක් වර්ෂයක් පසුවීමට පෙර සහ ඉන්පසු සෑම වර්ෂයක් පාසාම ගැසට් පත්‍රයේ පළ කිරීමට කටයුතු කළ යුතු ය.

(3) යම් අපරාධ හෝ සිවිල් නඩු කටයුත්තක දී-

(අ) අවස්ථාවෝචිත පරිදි යම් තැනැත්තකුගේ නම වරලත් පහසුකම් කළමනාකරුවකු ලෙස නාමලේඛනයේ ලියාපදිංචි වී ඇති ද නොමැති ද යන්න පෙන්නුම් කරන නාමලේඛනයේ උද්ධෘතයක් හෝ පිටපතක්; හෝ

(ආ) යම් තැනැත්තකුගේ නම වරලත් පහසුකම් කළමනාකරුවකු ලෙස නාමලේඛනයේ ලියාපදිංචි වී ඇති ද, නොමැති ද යන්න සඳහන් කරමින් රෙජිස්ට්‍රාර්වරයා විසින් නිකුත් කරනු ලැබූ සහතිකයක්,

එහි සඳහන් කාරණා පිළිබඳ බැලූ බැල්මට සාක්ෂි සංයුක්ත කරනු ලැබිය යුතු ය.

වරලත් පහසුකම් කළමනාකරුවන් ලියාපදිංචි කිරීම

**26.** (1) සභාව විසින් වරලත් පහසුකම් කළමනාකරුවකු ලෙස ලියාපදිංචි වීම සඳහා සහ එකී ලියාපදිංචිය අලුත් කිරීම ද සඳහා වන ඉල්ලුම් පත්‍ර සහ එකී ලියාපදිංචි වීම සඳහා ගෙවිය යුතු ගාස්තු ද නියම කළ යුතු ය.

(2) පූර්ව විධිවිධානය යටතේ නිශ්චිතව දක්වනු ලබන ගාස්තු සංස්ථාපිත මණ්ඩලයට ගෙවනු ලැබිය යුතු ය. සාමාජිකත්ව කටයුතු පිළිබඳ මණ්ඩලය විසින් පනත යටතේ තම බලතල, කාර්ය සහ කර්තව්‍ය ක්‍රියාත්මක කිරීමේ දී, කිරීමේ දී සහ ඉටු කිරීමේ දී එයට උපචිත වන්නා වූ වියදම් පියවීම සඳහා සාමාජිකත්වයට අවශ්‍ය වන්නා වූ සියලු මුදල් සභාවේ අනුමැතියට යටත් විය යුතු ය.

(3) සාමාජිකත්ව කටයුතු පිළිබඳ මණ්ඩලය විසින්, ලියාපදිංචි වීම සඳහා වූ ඉල්ලුම්පත්‍ර පිළිබඳව එවැනි ඉල්ලුම්පත්‍ර ලැබීමෙන් එක් මසක් ඇතුළත තීරණයක් ගත යුතු අතර, එකී තීරණයෙන් එක් මසක් ඇතුළත එකී තීරණය ඒ සඳහා හේතු ද සමඟ ඉල්ලුම්කරුට දැන්විය යුතු ය.

නාමලේඛනයෙන් නම් ඉවත්කිරීම සඳහා ඇති බලය

**27.** සභාවේ අනුමැතියට යටත් ව අදාළ නාමලේඛනයෙන් යම් තැනැත්තකුගේ නම ඉවත් කිරීමට සාමාජිකත්ව කටයුතු පිළිබඳ මණ්ඩලයට, පහත සඳහන් හේතු මත බලය ඇත්තේ ය, එනම්-

(අ) එකී තැනැත්තාට ලියාපදිංචි වීම සඳහා හිමිකම ලබාදුන් සුදුසුකම් සන්තකව තිබීම අවසන් වීම;

(ආ) එකී තැනැත්තා 17(2) වන වගන්තියේ සඳහන් නුසුදුසුකම්වලට යටත් වීම; සහ

(ඇ) එකී තැනැත්තාගේ ලියාපදිංචිය වංචාවෙන් හෝ අවනිර්දේශයෙන් ලබාගෙන තිබීම; හෝ

(ඈ) එකී තැනැත්තා සංස්ථාපිත මණ්ඩලයේ සාමාජිකයකු ලෙස සිටින අතර, ආයතනයේ අනුනීතිවල විධිවිධාන යටතේ සාමාජිකත්වයෙන් ඉවත් කිරීම.

රීති සෑදීමට බලය

**28.** (1) සංස්ථාපිත මණ්ඩලය විසින් එහි යම් මහා සභා රැස්වීමක දී එයට පැමිණ ඡන්දය දෙන වෘත්තීය සාමාජිකයන් තුනෙන් දෙකකට නොඅඩු බහුතර ඡන්දයෙන් මේ පනතේ විධිවිධාන හෝ වෙනත් යම් ලිඛිත නීතියක විධිවිධානවලට අනනුකූල නොවන්නා වූ රීති, පහත සඳහන් සියලු කාරණා හෝ ඉන් කිසිවක් හෝ සඳහා කලින් කල සෑදීම නීත්‍යානුකූල විය යුතු ය:-

(අ) සාමාජිකත්වය වර්ග කිරීම, එක් එක් ශ්‍රේණියේ සාමාජිකයන් විසින් ගෙවිය යුතු ගාස්තු සහ සාමාජිකයන් ඇතුළත් කරගැනීම, ඉවත් කිරීම, නෙරපීම හෝ ඉල්ලා අස්වීම;

(ආ) සභාවේ සංයුතිය සහ එය තෝරා පත් කර ගැනීම, ධුර කාලය, නිලධරයන්ගේ ඉල්ලා අස්වීම, ධුරයෙන් පහ කිරීම හෝ ධුරය හිස් කිරීම සහ සභාවේ බලතල, කාර්ය සහ කර්තව්‍ය;

(ඇ) සංස්ථාපිත මණ්ඩලයේ නිලධරයන්, අනුයෝජිතයන් සහ සේවකයන්ගේ බලතල, කාර්ය සහ කර්තව්‍ය සහ ඔවුන්ගේ පත්කිරීම්, පාරිශ්‍රමික, ධුරයෙන් පහ කිරීම සහ ධුරය අවසන් කිරීම;

(ඈ) සංස්ථාපිත මණ්ඩලයේ සහ සභාවේ හා එහි යම් අනු කමිටුවල රැස්වීම් කැඳවීමේ දී හා පැවැත්වීමේ දී අනුගමනය කළ යුතු කාර්ය පටිපාටිය, ගණපූරණය සහ රැස්වීම්වල කටයුතු කරගෙන යාම;

(ඉ) සංස්ථාපිත මණ්ඩලයේ සහ සභාවේ සාමාජිකත්වය ලබාගැනීම සඳහා අවශ්‍ය සුදුසුකම් හා නුසුදුසුකම්;

(ඊ) සංස්ථාපිත මණ්ඩලයේ සාමාජිකයින් සඳහා වෘත්තීය චර්යා සංග්‍රහයක් සෑදීම;

(උ) සංස්ථාපිත මණ්ඩලයේ දේපළ පරිපාලනය කිරීම සහ කළමනාකරණය කිරීම සහ පොදුවේ සංස්ථාපිත මණ්ඩලයේ කටයුතු කළමනාකරණය කිරීම;

(ඌ) යම් ගිවිසුම් හෝ එකඟතාවලට ඇතුළු වීම සහ යම් පුද්ගලයන් හෝ සංවිධාන සමග යම් ව්‍යාපාර කටයුතු පිළිබඳව ගිවිස ගැනීම;

(එ) මුදල් ණයට ගැනීම සහ සංස්ථාපිත මණ්ඩලයේ වගකීම සහ දේපළ උකස් කිරීම හෝ පැවරීම.

(2) සංස්ථාපිත මණ්ඩලයේ සෑම සාමාජිකයකුම, මේ පනත ක්‍රියාත්මකභාවයට පැමිණීමේ දී සංස්ථාපිත මණ්ඩලය විසින් කලින් කල සාදනු ලබන රීතිවලට යටත් විය යුත්තේ ය.

(3) මේ පනත ක්‍රියාත්මකභාවයට පැමිණීමෙන් ඉක්බිතිවම මහා සභා රැස්වීමක දී සම්මත කරගනු ලබන රීති (1) වන උපවගන්තිය යටතේ සාදන ලද ලෙස සැලකිය යුතු අතර, (4) වන උපවගන්තියට යටත්ව සියලු කාර්යයන් සඳහා සංස්ථාපිත මණ්ඩලයේ රීති විය යුතු ය.

(4) අනු නීති, සංස්ථාපිත මණ්ඩලයේ මහා සභා රැස්වීමක දී (1) වන උපවගන්තියේ විධිවිධානවලට අනුකූලව අවශ්‍ය බහුතර සාමාජිකයන්ගේ ඡන්දයෙන් වෙනස් කිරීම, ඒවාට යමක් එකතු කිරීම හෝ සංශෝධනය කිරීම හෝ අවලංගු කිරීම කළ හැකි ය.

(5) (1) වන උපවගන්තිය යටතේ සාදනු ලබන රීති, එකී රීති සෑදීමෙන් මාස තුනක් ඇතුළත *ගැසට් පත්‍රයේ* පළ කරනු ලැබිය යුතු අතර, එහි දිනයේ සිට බලාත්මක විය යුතු ය.

සංස්ථාපිත මණ්ඩලයේ දේපළ

**29.** මේ පනත යටතේ සංස්ථාපිත මණ්ඩලය විසින් අත්කර ගන්නා වූ හෝ සංස්ථාපිත මණ්ඩලය විසින් දරනු ලබන්නා වූ චංචල හෝ නිශ්චල සියලු දේපළ සහ සංස්ථාපිත මණ්ඩලයට ගෙවන ලද හෝ ලැබුණු සියලු මුදල් සංස්ථාපිත මණ්ඩලය විසින් එහි රීතිවලට අනුකූලව දැරීම, භාවිත කිරීම සහ යෙදවීම කරනු ලැබිය යුතු ය.

සංස්ථාපිත මණ්ඩලයේ අරමුදල

**30.** (1) සංස්ථාපිත මණ්ඩලයට එහිම අරමුදලක් තිබිය යුතු ය.

(2) සංස්ථාපිත මණ්ඩලය සඳහා සහ එය වෙනුවෙන් ත්‍යාග, රික්තවරණ, පරිත්‍යාග, ග්‍රාහක මුදල් සහ දායක මුදල් වශයෙන් මීට පෙර ලැබුණු සහ මින් පසු ලැබෙන සියලු මුදල්, සභාව විසින් නිශ්චය කරනු ලබන එක් බැංකුවක හෝ බැංකු කිහිපයක සංස්ථාපිත මණ්ඩලයේ බැරට තැන්පත් කළ යුතු ය.

(3) මේ පනත යටතේ ස්වකීය බලතල, කාර්ය සහ කර්තව්‍ය ක්‍රියාත්මක කිරීමේ දී සහ ඉටු කිරීමේ දී සංස්ථාපිත මණ්ඩලය විසින් දරනු ලබන වියදම් පියවීමට අවශ්‍ය සියලු මුදල් අරමුදලින් ගෙවනු ලැබිය යුතු ය.

ගිණුම් සහ විගණනය

**31.** (1) සංස්ථාපිත මණ්ඩලයේ මුදල් වර්ෂය ලිත් වර්ෂය විය යුතු ය.

(2) සංස්ථාපිත මණ්ඩලය විසින් එහි ආදායම සහ වියදම, වත්කම් සහ බැරකම් සහ වෙනත් ගනුදෙනු පිළිබඳ නිසි ගිණුම් තබා ගැනීම කළ යුතු ය.

(3) සංස්ථාපිත මණ්ඩලයේ ගිණුම් සුදුසුකම්ලත් විගණකවරයකු විසින් පරීක්ෂා කොට විගණනය කරනු ලැබිය යුතු ය.

(4) මේ වගන්තියේ කාර්යය සඳහා “සුදුසුකම්ලත් විගණකවරයා” යන්නෙන්:-

(අ) 1959 අංක 23 දරන ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරීන්ගේ ආයතනයේ හෝ නීතියෙන් පිහිටුවන ලද වෙනත් යම් ආයතනයක හෝ සාමාජිකයකු වූ ද, ගණකාධිකාරිවරයකු වශයෙන් වෘත්තියේ යෙදීම සඳහා එම ආයතනයේ සභාව විසින් නිකුත් කරන ලද සහතිකයක් දරන්නා වූ ද: හෝ

(ආ) යම් ගණකාධිකාරි සමාගමක එක් එක් නේවාසික හවුල්කරු ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරින්ගේ ආයතනයේ හෝ නීතියෙන් පිහිටුවන ලද වෙනත් යම් ආයතනයක හෝ සාමාජිකයකු වූ ද, ගණකාධිකාරිවරයකු වශයෙන් වෘත්තියෙහි යෙදීම සඳහා එකී ආයතනයේ සභාව විසින් නිකුත් කරන ලද සහතිකයක් දරන්නා වූ ද,

සාමාජිකයකුගෙන් යුත් එවැනි වරලත් ගණකාධිකාරි සමාගමක් අදහස් වේ.

වාර්ෂික වාර්තාව

**32.** සභාවේ වාර්ෂික වාර්තාවට, සෑම වර්ෂයකම අප්‍රේල් මස පළමුවන දිනයෙන් ආරම්භව ඊළඟ වර්ෂයේ මාර්තු මස තිස් එක් වන දිනයෙන් අවසන් වන මාස දොළහක කාලයක් සඳහා සකස් කරනු ලබන මූල්‍ය ප්‍රකාශයක් සහ ගිණුම් ද, ශේෂ පත්‍රය සහ විගණක වාර්තාව ද ඇතුළත් විය යුතු ය.

සංස්ථාපිත මණ්ඩලයට අයවිය යුතු සහ එය විසින් ගෙවිය යුතු ණය මුදල්

**33.** මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භ වන දිනයට පෙරාතුවම වූ දිනයේ දී පැවති ආයතනයේ සියලු ණය සහ බැරකම් සංස්ථාපිත මණ්ඩලය විසින් ගෙවිය යුතු හෝ ගෙවා නිදහස් හෝ කළ යුතු අතර, එදිනට ආයතනයට අයවිය යුතු සියලු ණය සහ ආයතනය වෙත ගෙවිය යුතුව ඇති සියලු සාමාජික මුදල් සහ දායක මුදල් මේ පනතේ කාර්ය සඳහා සංස්ථාපිත මණ්ඩලයට ගෙවිය යුතු ය.

සංස්ථාපිත මණ්ඩලයේ මුද්‍රාව

**34.** සංස්ථාපිත මණ්ඩලයේ මුද්‍රාව සභාවේ ලේකම්වරයා හෝ සභාව විසින් විධිමත් ලෙස බලය දෙන ලද සභාවේ සාමාජිකයකු සහ සභාවේ වෙනත් එක් සාමාජිකයකු ද ඉදිරිපිට දී මිස කිසිම සාධන පත්‍රයකට තබනු නොලැබිය යුතු අතර, ඔවුන් තමන් පැමිණ සිටි බවට සලකුණක් වශයෙන් එකී සාධන පත්‍රයෙහි තම නම අත්සන් කළ යුතු අතර, එකී අත්සන් කිරීම සාක්ෂිකරුවකු වශයෙන් යම් තැනැත්තකුගේ අත්සන් කිරීමකට පරිබාහිර විය යුතු ය.

මේ පනත යටතේ හෝ සංස්ථාපිත මණ්ඩලයේ විධානය අනුව සිදු කරන ලද ක්‍රියා සඳහා ආරක්ෂාව

**35.** (1) කිසිදු සිවිල් හෝ අපරාධ නඩු කටයුත්තක්-

(අ) මේ පනත යටතේ සංස්ථාපිත මණ්ඩලය විසින් සද්භාවයෙන් කරන ලද හෝ කරන ලදැයි උද්දේශිත යම් නීත්‍යානුකූල ක්‍රියාවක් සඳහා සංස්ථාපිත මණ්ඩලයට එරෙහිව; හෝ

(ආ) සංස්ථාපිත මණ්ඩලයේ යම් සාමාජිකයකු, නිලධරයකු, සේවකයකු හෝ අනුයෝජිතයකු විසින් අවස්ථාවෝචිත පරිදි මේ පනත යටතේ හෝ සභාවේ විධානය මත කරන ලද හෝ කරන ලදැයි උද්දේශිත යම් ක්‍රියාවක් සඳහා එකී සාමාජිකයා, නිලධරයා, සේවකයා හෝ අනුයෝජිතයාට එරෙහිව,

නොපැවරිය යුතු ය.

(2) මේ පනත යටතේ හෝ සංස්ථාපිත මණ්ඩලයේ විධානය මත කරනු ලැබූ යම් ක්‍රියාවක් සඳහා (1) වන උපවගන්තියේ නිශ්චිතව සඳහන් යම් තැනැත්තකුට එරෙහිව පවරන ලද යම් සිවිල් හෝ අපරාධ නඩු කටයුත්තක දී, ඒ තැනැත්තාට උපචිත වූ යම් වියදම්, එකී ක්‍රියාව සද්භාවයෙන් කරන ලද බවට අධිකරණය විසින් නිශ්චය කරනු ලබන්නේ නම් සංස්ථාපිත මණ්ඩලයේ අරමුදලින් ගෙවිය යුතු ය.

**36.** මේ පනතේ - අර්ථ නිරූපණය

"IFMSL" යන්නෙන්, ශ්‍රී ලංකාවේ ස්ථාපිත වෘත්තීය මණ්ඩලයක් වන ශ්‍රී ලංකා පහසුකම් කළමනාකරණ ආයතනය අදහස් වේ;

"සාමාජිකත්වය" යන්නෙන්, මේ පනතේ නිශ්චිතව සඳහන් උපමානවලට අනුකූල වූ විවිධ කාණ්ඩවල IFMSL සාමාජිකයන් අදහස් වේ;

"මහා සභා රැස්වීම" යන්නෙන්, සංස්ථාපිත මණ්ඩලයේ රීතිවලට අනුකූලව කැඳවනු ලබන සහ පවත්වනු ලබන සංස්ථාපිත මණ්ඩලයේ සාමාජිකයන්ගේ රැස්වීමක් අදහස් වේ;

"රීති " යන්නෙන්, මේ පනතේ 28(1) වන වගන්තියට අනුකූලව සංස්ථාපිත මණ්ඩලය විසින් කලින් කල සාදනු ලබන IFMSL හි රීති අදහස් වේ.

"වෘත්තීය සාමාජිකයා" යන්නෙන්, අධි සාමාජිකයකු හෝ සාමාජිකයකු වශයෙන් සංස්ථාපිත මණ්ඩලයේ තත් කාලයේ සාමාජිකත්වය දරන තැනැත්තකු වූ ද, පනතේ 9 වන වගන්තියේ විධිවිධාන ප්‍රකාර ලියාපදිංචි වීමෙන් පසු වරලත් පහසුකම් කළමනාකරුවකු ලෙස සඳහන් කරනු ලැබිය යුතු වූ ද තැනැත්තකු අදහස් වේ;

"සභාව" යනුවෙන් ද සඳහන් කරනු ලබන "මහා සභාව" යන්නෙන්, පනතේ සහ ඒ යටතේ සාදන ලද රීති වල විධිවිධානවලට යටත්ව සංස්ථාපිත මණ්ඩලයේ කළමනාකරණය, පාලනය සහ පරිපාලනය සඳහා තෝරා පත් කර ගනු ලබන නිලධර මඬුල්ල අදහස් වේ;

"රෙජිස්ට්‍රාර්වරයා" යන්නෙන්, සාමාජිකත්ව කටයුතු පිළිබඳ මණ්ඩලයේ රෙජිස්ට්‍රාර්වරයා/ ලේකම්වරයා ලෙස සභාව විසින් පත් කරනු ලබන වෘත්තීය සාමාජිකයා අදහස් වේ.

ජනරජයේ හෝ අන්‍යයන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීම

**37.** මේ පනතේ ඇතුළත් කිසිවකින් ජනරජයේ හෝ යම් රාජ්‍ය මණ්ඩලයක හෝ සංස්ථාවක හෝ යම් අයිතිවාසිකම්වලට හානියක් හෝ බලපෑමක් නොවිය යුතු ය.

අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව

**38.** මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇති වුවහොත්, එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.